**චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථාභාරයේ ගනුදෙනු වාර්තාව - 2019**

-----------------------------------------------------------------------------------------------------------------

චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථාභාරයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

-----------------------------------------------------------------------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්තිත්‍යයක් විසින්ම එම අස්තිත්‍යය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්තිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, රීති මගින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්තිත්‍යවල වාර්ෂික කාර්යසාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38(1)(ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීමට සිදු වන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්තිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය. එසේ වුවද 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව, අරමුදල්වල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, ගිණුම් වර්ෂය අවසන්වී දින 60ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, 2019 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දිනය වන විටත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

**2. විගණන නිරීක්ෂණ**

----------------------

**2.1 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

-------------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **නීති රීති /විධි විධාන වලට යොමුව** | **අනුකූල නොවීම** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| 1986 අංක 3 දරන චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථා භාරය පනත | | | |
| (අ) 3.1 සහ 3.2 වගන්ති | (i) භාරයෙහි කළමනාකරණය සහ පාලනය සඳහා භාරකාර මණ්ඩලයක් පත්කළ යුතු වුවත් | 1986 අංක 03 දරන චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ ජාතික | භාරයේ කළමනාකරණය සහ පාලනය සඳහා |

| | | | | |
|---|---|---|---|---|
| | | 2013 වර්ෂයේ සිට භාරකාර මණ්ඩලයක් පත්කර නොතිබුණි. | චිත්‍රපට සංස්ථා භාරය පනතෙහි අංක 03 ට අනුව පරිපාලනය, කළමනාකරණය සහ පාලනය යන කරුණු සංස්ථාපනය කිරීම සඳහා භාරකාර මණ්ඩලයක් පත් කර ගැනීමට දිගින් දිගටම රේඛීය අමාත්‍යාංශය සමඟ කටයුතු කර ඇත. | භාරකාර මණ්ඩලයක් පත්කළ යුතුවීම. |
| | | (ii) භාරයෙහි විශ්‍රාමලාභී සාමාජිකයෙකු ජීවත්ව සිටීද යන්න පිළිබඳව නිසි තහවුරුකර ගැනීමේ ක්‍රමවේදයක් අනුගමනය කිරීමකින් තොරව මාස්පතා විශ්‍රාම දීමනාව බැංකුගත කර තිබුණි. | දැනට එවැනි ගැටළුකාරී තත්වයන් උද්ගත නොවන සේ නව විශ්‍රාම වැටුප්ලාභීන්ගේ විස්තර යාවත්කාලීන කිරීමට පියවර ගෙන ඇත. | වාර්ෂිකව සාමාජිකයෙකු ජීවත්වීමේ සහතිකයක් ලබා ගත යුතුවීම. |
| | | (iii) භාරය මගින් ලබාදෙන ප්‍රතිලාභ පිළිබඳව කලාකරුවන් හා කාර්මිකයින් දැනුවත් කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබීම නිසා නව ප්‍රතිලාභීන් අරමුදලට දායක කර ගැනීමට නොහැකි තත්ත්වයක් ඇති වී තිබුණි. | මෙම කරුණ සම්බන්ධයෙන් දැනුවත් වීම් ජාතික චිත්‍රපට සංස්ථා නිල වෙබ් අඩවිය මගින් සහ නව විශ්‍රාම වැටුප් ප්‍රදානයන් සඳහා විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය වෙතින් ලබා දෙනු ලබන ප්‍රචාරක කටයුතු මගින් ද සිදු වේ. | සාමාජිකයින්ට භාරය මගින් ලබාදෙන ප්‍රතිලාභ සම්බන්ධ දැනුවත් කිරීමට වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුවීම. |
| (ආ) | 6.2(අ) වගන්තිය | අරමුදල් උපයා ගැනීමට සුදුසු වැඩසටහන් හෝ ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීමට සමාලෝචිත වර්ෂය තුළ කටයුතු කර නොතිබුණි. | 2018 වසරෙහි රාජ්‍ය අංශය දැනුවත් කිරීමට පියවර ගෙන අරමුදල් තර කර ගැනීමට කටයුතු කර ඇත. | අරමුදල් උපයා ගැනීමට වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතුවීම. |
| (ඇ) | 5(3) (අ) වගන්තිය | මියගිය කලාකරුවන්ගේ අවමංගල්‍ය වියදම් වෙනුවෙන් යම් මූල්‍ය ආධාරයක් පිරිනැමිය යුතු වුවත් එපරිදි කටයුතු කර නොතිබුණි. | මෙම කරුණ සම්බන්ධයෙන් මිය ගිය විශ්‍රාම වැටුප්ලාභීන්ගේ නිත්‍යානුකූල පාර්ශවයන් දැනුවත් කල ද ඊට අදාල ඉල්ලීම් සහ ලේඛන ඉදිරිපත් නොවීම මත මූල්‍ය ආධාර පිරිනැමීමක් සමාලෝචිත වර්ෂය තුල සිදු ව නොමැත. | මියගිය කලාකරුවන්ගේ අවමංගල්‍ය කටයුතු සඳහා මූල්‍ය ආධාරයක් පිරිනැමීම සිදුකළ යුතුවීම. |

## 2.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | චිත්‍රපට කලාකරුවන්ට හා කාර්මිකයන්ට දායක විශ්‍රාම වැටුප් ක්‍රම සකස් කිරීම, යහසාධක අරමුදල්, ඉතිරි කිරීමේ අරමුදල්, ඉතිරි කිරීමේ හෝ සකසුරුවම් සමිති සහ වෙනත් සමාන යෝජනා ක්‍රම පිහිටුවීම, විශ්‍රාම වැටුපක්, ණයක්, දීමනාවක්, නිවාස පහසුකමක් හෝ වෙනත් සමාන ප්‍රතිලාභයක් පිරිනැමීම, කායික හෝ මානසික අබලතාවකට පත්ව සිය වෘත්තියෙහි යෙදීමට නොහැකිව සිටී නම්, යම් මුදල් ආධාරයක් පිරිනැමීම, අවමංගල්‍ය වියදම් වෙනුවෙන් මුදල් හෝ වෙනත් ආධාර පිරිනැමීම සංස්ථා හාරයේ ප්‍රධාන අරමුණු වුවත් ඒ සඳහා මූල්‍ය සම්පාදන මාර්ග කෙරෙහි අවධානය යොමු වී නොතිබුණු බව නිරීක්ෂණය විය. | චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ සංස්ථා භාරය පනතෙහි අංක 05 න් දක්වන ලද භාරයේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ජාතික චිත්‍රපට සංස්ථාව අවධානය යොමු කර 2018 වසරෙහි රු.මිලියන 10 ක මූල්‍ය ප්‍රතිපාදන මහා භාණ්ඩාගාර වෙතින් ලබා ගැනීමට කටයුතු කර ඇත. | සාමාජිකයන්ගේ අභිවෘද්ධිය සඳහා ඉතිරිකිරීමේ හෝ සකසුරුවම් සමිති පිහිටුවීම සඳහා මූල්‍ය සම්පාදන මාර්ග සඳහා අවධානය යොමුකළ යුතුවීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා විශ්‍රාම වැටුප් වශයෙන් එකතුව රු.9,370,000 ක් ප්‍රදානය කර තිබුණු අතර මරණාධාර හා වෛද්‍යාධාර වශයෙන් කිසිදු මුදලක් ගෙවා නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | සාමාජිකයන්ට මරණාධාර හා වෛද්‍යාධාර ලබාදීමට ඇති හැකියාව සලකා බැලිය යුතුවීම. |

## 2.3 කළමණාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| භාරයේ රීතී මාලා අංක 3.5 අනුව වෙනත් ආකාරයකින් විශ්‍රාම ප්‍රතිලාභයක්, අර්ථසාධක මුදලක් හෝ සහනාධාරයක් ලබයි නම් විශ්‍රාම ප්‍රතිලාභ ලැබීමට නුසුදුසු වුවත්, භාරය විසින් විශ්‍රාම ප්‍රතිලාභ ගෙවනු ලබන කලාකරුවන් සම්බන්ධයෙන් මෙතෙක් එම රීතිය ප්‍රකාරව පරීක්ෂාවකට ලක්කර හෝ තොරතුරු රැස්කිරීමට කටයුතු කර නොතිබුණි. | භාරකාර මණ්ඩලය පත් වීමෙන් අනතුරුව එවැනි ප්‍රතිලාභින් සිටී නම් ඔවුන්ගේ විශ්‍රාම වැටුප් ගෙවීම් සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට කටයුතු කරනු ඇත. | භාරයේ රීති අංක 3.5 අනුව විශ්‍රාම ප්‍රතිලාභ ලැබීමට නුසුදුසු සාමාජිකයින් හඳුනාගැනීමට තොරතුරු කැඳවිය යුතුවීම. |

**2.4** අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සංස්ථාභාරය සතු බැංකු ජංගම ගිණුමේ 2019 අවසාන කාර්තුවේ සාමාන්‍ය මාසික ශේෂය රු.මිලියන 9.25 ක් වූ අතර එම මුදල් ඵලදායී ලෙස කෙටිකාලීනව ආයෝජනය කර අමතර ආදායමක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණ නිවැරදිය. ඉදිරියේ දී ඵලදායි ලෙස කෙටිකාලින ආයෝජන මඟින් අමතර ආදායමක් ලබා ගැනීමට කටයුතු කරනු ඇත. | ජංගම ගිණුමේ අතිරික්ත මුදල් කෙටිකාලීනව ආයෝජනය කර ආදායමක් ලබාගත යුතුවීම. |